# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2064/40 - 2018 මාර්තු මස 29 වැනි බ්‍රහස්පතින්දා - 2018.03.29

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ සංශෝධිත දැන්වීමයි

*මගේ අංකය*: 3/6/2016/7.

*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය*:
4-3/72016/එච්ඩබ්/118.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2005/47 හා 2017.02.09 දිනැති *අති විශේෂ ගැසට් පත්‍රයෙ* හි මා විසින් එල කර ඇති 07 වැනි වගන්තිය යටතේ දැන්වීමෙහි අත්කර ගැනීමට බලාපොරොත්තු වන ඉඩම් විස්තරය යටතේ මූලික පිඹුරු අංක කු1493 හි අනු අංක 22 යටතේ (පිටු අංක 2A) කැබලි අංක 545 දරන ඉඩම් කැබැල්ල අවලංගු කරනු ලබන අතර ඒ වෙනුවට පහත දක්වා ඇති ඉඩම් කැබලි ආදේශ කරනු ලැබේ:

01. කැබලි අංක 588

ඉඩමේ නම: වැරැල්ලෙලන්දෙ වත්ත; ඉඩම් පරිහරණය: මිශ්‍ර වගාවක් සහිත ගෙවත්ත; හිමිකම් පාන්නා: රජය; මුල් හිමිකම් පාන්නා: පොතුහැර, අමුණුගම, ගෝනමලේ වත්ත පදිංචි කේ. එම්. පුෂ්ප කුමාර කරුණානායක; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0256.

02. කැබලි අංක 589

ඉඩමේ නම: වැරැල්ලෙලන්දෙ වත්ත; ඉඩම් පරිහරණය: මිශ්‍ර වගාවක් සහිත ගෙවත්ත; හිමිකම් පාන්නා: රජය; මුල් හිමිකම් පාන්නා: පොතුහැර, අමුණුගම, අංක 365 හි පදිංචි කේ. එම්. දිනේෂ් කරුණානායක; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0069.

ඉහත ඉඩම් කැබලි සඳහා අයිතිවාසිකම් කියන සියලුදෙනාම, *ගැසට් පත්‍රයේ* නම සඳහන් වී ඇතත්, නැතත් එම ඉඩම් සම්බන්ධයෙන් තමනට ඇති අයිතිවාසිකම් එක් එක් බිම් කැබැල්ල වෙනුවෙන් වෙන වෙනම පිටපත් දෙකකින් යුත් ලියවිල්ලකින් එම ඉඩම්වලට ඇති ස්වකීය අයිතියේ ස්වභාවය හා එම ඉඩම් කැබලි සඳහා තමන්ට ඉදිරිපත් කළ හැකි කරුණු පිළිබද විස්තරයත් 2018.04.11 වැනි දින පෙ.ව. 10.00ට මාගේ කාර්යාලයේදී මා වෙත ඉදිරිපත් කරන ලෙස දැනුම් දෙමි.

ඒ අනුව මා විසින් දැනුම් දෙනු ලබන දිනයකදී තමන් විසින් ම *නැතහොත්* තමන් විසින් ලිඛිතව බලය පවරන ලද නියෝජිතයෙකු නියමිත දින නියමිත වේලාවට අදාළ ඔප්පු හා මා විසින් නියම කරනු ලබන ලියකියවිලි සමග පොල්ගහවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී පරීක්ෂණයක් සඳහා ඉදිරිපත් විය යුතුය.

මීට අමතරව තමන් විසින් හිමිකම් කියනු ලබන ඉඩම් කොටස සඳහා ඉල්ලා සිටිනු ලබන වන්දි මුදල හා එම වන්දි මුදල ගණන් බැලූ ආකාරය පිටපත් දෙකකින් යුතුව ඉදිරිපත් කළ යුතුය.

1A - G 27384 - 17 (2018/03)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

පරික්ෂණය සඳහා නියෝජිතයෙකු ඉදිරිපත් කරන්නේ නම් ඉඩම් හිමිකම් කියන්නා විසින් බලය පවරන ලද ලිපියක් නොමැතිව එකී නියෝජිතයාගෙන් ප්‍රකාශ හෝ සාක්ෂි සටහන් නොකරගනු ලබන බව අවධාරණය කරමි.

පරීක්ෂණ දිනය හා වේලාව එක් එක් හිමිකම් කියන්නා වෙත වෙන වෙනම දැනුම් දෙනු ලැබේ.

ඩී. අනෝමා දිසානායක,
ප්‍රාදේශීය ලේකම් හා ඉඩම් අත්කර ගැනීමේ නිලධාරි,
පොල්ගහවෙල.

2018 මාර්තු මස 27 වැනි දින,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
පොල්ගහවෙල.

04 - 514

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.